# මූලික පිරිවෙන් අවසාන විභාගය

# පාලි භාෂාව

## (නිර්දිෂ්ට ඡේද පරිවර්තනය)




රාජකීය පණ්ඩිත පදියතලාවේ ඤාණවිමල හිමි

මො / ශ්‍රී විද්‍යානන්ද පිරිවෙණ

යල්කුඹුර - බිබිල.

077 8438417

070 6438417

පඨමො පාඨො

# නමො මහාකාරුණිකස්ස තස්ස !!!

යො කප්පකොටීහිපි අප්පමෙය්‍යං
කාලං කරොන්තො අතිදුක්කරානි,
ඛෙදං ගතො ලොකහිතාය නාථො
නමො මහාකාරුණිකස්ස තස්ස.

අසම්බුධං බුද්ධනිසෙවිතං යං
භවාභවං ගච්ඡති ජීවලොකො
නමො අවිජ්ජාදිකිලෙසජාල
විද්ධංසිනො ධම්මවරස්ස තස්ස.

ගුණෙහි යො සීලසමාධිපඤ්ඤා
විමුත්තිඤාණප්පභුතීහි යුත්තො
ඛෙත්තං ජනානං කුසලත්ථිකානං
තමරියසඞ්ඝං සිරසා නමාමි.

(සමන්තපාසාදිකා)

## පළමු පාඩම

## නමො මහාකාරුණිකස්ස තස්ස

1. ලෝක නායක වූ යම් සර්වඥයන් වහන්සේ නමක් කප් කෙළ ගණනිදු පමණ නොකළ හැකි කලක් මුළුල්ලෙහි අතිශය දුෂ්කර ක්‍රියාවක් කරනුයේ ලෝක සත්ත්වයාට හිත පිණිස, කායික පරිශ්‍රමයට පැමිණියේ ද, මහා කරුණික වූ ඒ ලෝක නායක වූ සර්වඥයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.

2. බුදුරදුන් විසින් නිති ඇසුරු කරන ලද යම් සපර්යාපත්තික නව ලෝකෝත්තර ධර්මයක් අවබෝධ නොකිරීම හේතු කොටගෙන, සත්ත්ව ලෝකය කුදු මහත් වූ භවයෙන් භවයට යේ ද, අවිද්‍යාදි ක්ලේශ සමූහය නසන සුලු වූ ඒ උතුම් ධර්මයට මාගේ නමස්කාරය වේවා.

3. ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥානාදි ගුණධර්මයන්ගෙන් යම් ආර්ය සමූහයක් යුක්ත වූයේ ද, පින් කැමති ජනයන්හට කෙතක් වැනි වූ ඒ ආර්ය සංඝරත්නය මස්තකයෙන් වඳිමි.

# දුතියො පාඨො | එතු ඛො භන්තෙ භගවා සවාගතං භන්තෙ

එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන වච්ඡගොත්තො පරිබ්බාජකො එකපුණ්ඩරීකෙ පරිබ්බාජකාරාමෙ පටිවසති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙසාලියං පිණ්ඩාය පාවිසි. අථ ඛො භගවතො එතදහොසි. අතිප්පගො ඛො තාව වෙසාලියං පිණ්ඩාය චරිතුං. යන්නූනාහං යෙන එකපුණ්ඩරීකො පරිබ්බාජකාරාමො, යෙන වච්ඡගොත්තො පරිබ්බාජකො තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛො භගවා යෙන එකපුණ්ඩරීකො පරිබ්බාජකාරාමො යෙන වච්ඡගොත්තො පරිබ්බාජකො තෙනුපසඞ්කමි. අද්දසා ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන භගවන්තං එතදවොච. එතු ඛො භන්තෙ, භගවා. සවාගතං භන්තෙ, භගවතො, චිරස්සං ඛො භන්තෙ භගවා ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු, භන්තෙ, භගවා ඉදමාසනං පඤ්ඤත්තන්ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. වච්ඡගොත්තොපි ඛො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි.

(තෙවිජ්ජවච්ඡගොත්ත සුත්ත - මජ්ඣිමනිකාය)

## දෙවන පාඩම

## එතු ඛො භන්තෙ භගවා සවාගතං භන්තෙ

එක් සමයක භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර සමීපයෙහි වූ මහා වනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩ වසන සේක. ඒ සමයෙහි වච්ඡගොත්ත පරිබ්‍රාජක තෙමේ ඒකපුණ්ඩරික (එක් ඇටඹ ගසක් ඇතියෙන්) නම් පරිබ්‍රාජක ආරාමයෙහි වාසය කරයි. එකල්හි බුදුරජාණන් වහන්සේ පෙරබත් වේලාවෙහි (පෙරබත්හි) හැඳ පොරවා පාසිවුරු ගෙන විශාලා මහනුවරට පිඬුසිඟා වැඩි සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේට මේ සිත විය. (මෙසේ සිතූ සේක). විශාලා මහනුවර පිඬු සිඟා යන්නට තව උදෑසන වෙයි. මම 'ඒකපුණ්ඩරික' නම් පරිබ්‍රාජකාරාමයෙහි වච්ඡගොත්ත පරිබ්‍රාජක යම් තැනක ද එහි එළඹීම නම් මැනවැ'යි යනුවෙනි. එකල්හි බුදුරජාණන් වහන්සේ ඒකපුණ්ඩරික නම් පරිබ්‍රාජකාරාමයෙහි වච්ඡගොත්ත පරිබ්‍රාජකයා යම් තැනෙක්හි ද එහි වැඩි සේක (එළඹුණු සේක).

වච්ඡගොත්ත පරිබ්‍රාජක දුරින් ම වඩිනා භාග්‍යවතුන් වහන්සේ දැක භාග්‍යවතුන් වහන්සේට මෙම වදන් කීවේ ය. 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පැමිණෙන සේක්වා, වහන්ස, භාග්‍යවතුන් වහන්සේට ස්වාගත ය, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙහි පැමිණීමෙන් බොහෝ කලෙකින් මේ පරියාය (කරුණ) කළ සේක. වහන්ස, බුදුහු

වැඩහිඳුනා සේක්වා. මේ අස්න පනවන ලදැ'යි. බුදුරජාණන් වහන්සේ පැන වූ ආසනයෙහි වැඩහුන් සේක. වච්ඡගොත්ත පරිබ්‍රාජක තැන ද එක්තරා මිටි අසුනක් ගෙන එකත්පසෙක හුන්නේ ය.

**තතියො පාඨො**

# අක්කොසමෙව අලත්ථ.

අථ ඛො ආයස්මා රට්ඨපාලො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන ථුල්ලකොට්ඨිතං තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන ථුල්ලකොට්ඨිතං තදවසරි. තත්‍ර සුදං ආයස්මා රට්ඨපාලො ථුල්ලකොට්ඨිතෙ විහරති රඤ්ඤො කොරව්‍යස්ස මිගාචීරෙ. අථ ඛො ආයස්මා රට්ඨපාලො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය ථුල්ලකොට්ඨිතං පිණ්ඩාය පාවිසි. ථුල්ලකොට්ඨිතෙ සපදානං පිණ්ඩාය චරමානො යෙන සකපිතුනිවෙසනං තෙනුපසංකමි. තෙන ඛො පන සමයෙන ආයස්මතො රට්ඨපාලස්ස පිතා මජ්ඣිමාය ද්වාරසාලාය උල්ලිඛාපෙති. අද්දසා ඛො ආයස්මතො රට්ඨපාලස්ස පිතා ආයස්මන්තං රට්ඨපාලං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන එතදවොච. "ඉමෙහි මුණ්ඩකෙහි සමණකෙහි අම්හාකං එකපුත්තකො පියො මනාපො පබ්බජිතො"ති. අථ ඛො ආයස්මා රට්ඨපාලො සකපිතුනිවෙසනෙ නෙව දානං අලත්ථ, න පච්චක්ඛානං, අඤ්ඤදත්‍ථු අක්කොසමෙව අලත්ථ. තෙන ඛො පන සමයෙන ආයස්මතො රට්ඨපාලස්ස ඤාතිදාසී ආභිදොසිකං කුම්මාසං ඡඩ්ඩෙතුකාමා හොති. අථ ඛො ආයස්මා රට්ඨපාලො තං ඤාතිදාසිං එතදවොච. "සචෙ තං භගිනි, ඡඩ්ඩනීයධම්මං ඉධ මෙ පත්තෙ ආකිරා' ති.

(රට්ඨපාල සුත්ත - මජ්ඣිමනිකාය)

## තෙවන පාඩම

## අක්කොසමෙව අලත්ථ

ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ හුනස්නෙන් නැගී බුදුන් වැඳ පැදකුණු කොට සෙනස්න සකසා තබා පා සිවුරු ගෙන ථුල්ලකොට්ඨිත නියම් ගම කරා චාරිකාවෙහි පිටත් ව ගියහ. අනුක්‍රමයෙන් සැරිසරන්නා වූ ථුල්ලකොට්ඨිත නියම් ගම යම් තැනක ද එතැනට එළඹියේ ය. එහි දී ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ ථුල්ලකොට්ඨිතයෙහි කෝරව්‍ය රජුගේ 'මිගාචීර' නම් උයනෙහි වැඩ වෙසෙති. ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ පෙරවරු වේලාවේ හැද පොරවා පාසිවුරු ගෙන ථුල්ලකොට්ඨිත නියම්ගමට පිඬු පිණිස පිවිසියහ. ථුල්ලකොට්ඨිතයෙහි ගෙපිළිවෙළින් පිඬු සිඟා වඩින්නාහු සිය පියාගේ නිවස කරා එළඹියහ. ඒ සමයෙහි ආයුෂ්මත් රට්ඨපාල තෙරුන්ගේ පියා මධ්‍යම ද්වාරශාලාවෙහි (සන්නාලියා ලවා) කෙස් පීරවයි. ආයුෂ්මත් රට්ඨපාල තෙරුන්ගේ පියතෙමේ ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් දුරින් ම එනු දැක මෙසේ කීවේ ය. 'මේ මුඩු මහණුන් විසින් අපගේ ප්‍රිය මනාප එක ම පුතු පැවිදි කරවන ලදැයි' යනුවෙනි. එකල්හි ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් සිය පියාගේ නිවාසයෙන් දානය නොලැබ, වෙනත් කිසිවක් නොලැබ ඒකාන්තයෙන් දොස් ම ලැබීය. ඒ සමයෙහි වනාහි ආයුෂ්මත් රට්ඨපාල තෙරුන්ගේ ඤාති දාසියක් රාත්‍රියක් පුරා නිවසේ තිබුණු කැවිලි බැහැර කරනු කැමති වෙයි. එකල්හි ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ ඒ ඤාති දාසියට

මෙසේ කීවාහු ය. 'ඉදින් නැගෙණියනි, ඒ බැහැර ලන දෙය මෙහි මාගේ පාත්‍රයට දමන්න' යනුවෙනි.

# චතුත්ථො පාඨො | උපාසකං මං භවං ගොතමො ධාරෙතු

එවං වුතෙත කුටදනෙතා බ්‍රාහමණො භගවනතං එතදවොච. අභිකකනතං භො ගොතම, අභිකකනතං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නිකකුජ්ජිතං වා උකකුජෙජය්‍ය, පටිචඡනනං වා විවරෙය්‍ය, මූළ්හසස වා මගගං ආචිකෙඛය්‍ය, අනධකාරෙ වා තෙලපජෙජාතං ධාරෙය්‍ය, චකඛුමනෙතා රූපානි දකඛිනතීති. එවමෙව භොතා ගොතමෙන අනෙකපරියායෙන ධමෙමා පකාසිතො, එසාහං භවනතං ගොතමං සරණං ගචඡාමි ධමමඤච භිකඛුසඞඝඤච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතගෙග පාණුපෙතං සරණං ගතං. එසාහං භො ගොතම සතත ච උසභසතානි, සතත ච වචඡතරසතානි, සතත ච වචඡතරීසතානි, සතත ච අජසතානි සතත ච උරබභසතානි මුඤචාමි, ජීවිතං දෙමි. හරිතානි චෙව තිණානි ඛාදනතු, සීතානි ච පානීයානි පිවනතු, සීතො ච නෙසං වාතො උපවායතූති. අථ ඛො භගවා කුටදනතසස බ්‍රාහමණසස ආනුපබබීකථං කථෙසි. සෙය්‍යථීදං? දානකථං සීලකථං සගගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙකඛමෙම ච ආනිසංසං පකාසෙසි. යදා භගවා අඤ්ඤාසි කුටදනතං බ්‍රාහමණං කලලචිතතං මුදුචිතතං විනීවරණචිතතං උදගගචිතතං පසනනචිතතං. අථ යා බුදධානං සාමුකකංසිකා ධමමදෙසනා, තං පකාසෙසි. දුකඛං සමුදයං නිරොධං මගගං. සෙය්‍යථාපි නාම සුදධං වත්ථං අපගතකාළකං සමමදෙව රජනං පටිගගණෙහය්‍ය, එවමෙව කුටදනතසස බ්‍රාහමණසස තසමිං යෙව ආසනෙ විරජං වීතමලං ධමමචකඛුං උදපාදි. යං කිඤචි සමුදයධමමං සබබං තං නිරොධධමමනති.

(කුටදනතසුතත - දීඝනිකාය)

## සිවුවන පාඩම

## උපාසකං මං භවං ගොතමො ධාරෙතු

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි කූඨදන්ත බමුණු තෙමේ 'වහන්ස, දේශනාව කදිම ය. වහන්ස, දේශනාව කදිම ය. වහන්ස, යටිකුරු කොට තිබුණු භාජනයක් උඩුකුරු කරන්නේ හෝ වේ ද, වැසුණු යමක් වැසුම් හැර දක්වන්නේ හෝ වේ ද, මං මුළාවූවෙකුට මඟ කියන්නේ හෝ වේ ද, ඇස් ඇතියන් රූප දකිතියි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේ හෝ වේ ද, වහන්ස එසේ ම භාග්‍යවතුන් වහන්සේ විසින් මට නොයෙක් අයුරින් දහම් පැවසිණි, වහන්ස, ඒ මම භාග්‍යවත් ගෞතමයන් වහන්සේගේ දහම ද භික්ෂු සංඝයා ද සරණ යමි. වහන්ස, අද පටන් දිවි හිමියෙන් සරණ ගිය උපාසකයෙකු කොට භවත් ගෞතමයන් වහන්සේ මා දැන වදාරණ සේක් වා. භවත් ගෞතමයන් වහන්ස, ඒ මම හත්සියයක් ගොනුන් ද හත්සියයක් නාඹු වස්සන් ද හත්සියයක් නාඹු වැස්සියන් ද හත්සියයක් එළුවන් ද හත්සියයක් තරුණ බැටළුවන් ද මුදාලමි. ඔවුන්ට අභය දෙමි. නිල් තණ බුදිත්වයි ද, සිසිල් පැන් බොත්වයි ද ඔවුන්ට සිසිල් පවන ද හමත්වයි කියායි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කූටදන්ත බමුණා හට දානකථා, ශීලකථා, ස්වර්ගකථා, කාමයන්ගේ ආදීනව, කාමයන්ගේ ලාමක බව, කාමයන්ගේ කෙලෙසීම, අත්හැරීමේ ආනිශංස පැවසූ සේක. භාග්‍යවතුන් වහන්සේ

යම්විටෙක කුටදන්ත බමුණා (දහම් ඇසීමෙන්) නිරෝගි සිත් වූවාහු, මොලොක් සිත් වූවාහු නීවරණයන්ගෙන් පහ වූ සිතැත්තහු ඔද වැඩීගිය පහන් සිතැත්තහු බව දත් සේක. එකල්හි දුක්ඛ සමුදය, දුක්ඛ නිරෝධ මාර්ග යන බුදුවරුන්ගේ යම් සාමොක්කංසික ධර්ම දේශනාවක් වේ නම් එය පැවසූ සේක. යම් සේ පිරිසිදු වූ පහ වූ කළු බව ඇති වස්ත්‍රයක් මොනවට වර්ණ ගන්නේ ද, එසේ ම කුටදන්ත බමුණා හට ඒ අසුනේ දී ම යමෙක් උපදනා සුලු නම් ඒ සියල්ල නැසෙන සුලු වෙයි යන රජස් රහිත කෙලෙස් මල රහිත දහම් ඇස පහළ විය.

## පඤ්චමො පාඨො

# උට්ඨෙහි සම්ම සුදින්න

අථ ඛො සුදින්නස්ස කලන්දකපුත්තස්ස සහායකා යෙන සුදින්නස්ස කලන්දපුත්තස්ස මාතාපිතරො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සුදින්නස්ස කලන්දකපුත්තස්ස මාතාපිතරො එතදවොචුං. "අම්ම, තාත, එසො සුදින්නො අනන්තරහිතාය භූමියා නිපන්නො 'ඉධෙව මෙ මරණං භවිස්සති පබ්බජ්ජා වා'ති. සචෙ තුම්හෙ සුදින්නං නානුජානිස්සථ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, තත්ථෙව මරණං ආගමිස්සති. සචෙ පන තුම්හෙ සුදින්නං අනුජානිස්සථ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, පබ්බජිතම්පි නං දක්ඛිස්සථ. සචෙ සුදින්නො නාභිරමිස්සති අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, කා තස්ස අඤ්ඤා ගති භවිස්සති? ඉධෙව පච්චාගමිස්සති. අනුජානාථ සුදින්නං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. "අනුජානාම, තාත, සුදින්නං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. අථ ඛො සුදින්නස්ස කලන්දකපුත්තස්ස සහායකා යෙන සුදින්නො කලන්දකපුත්තො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සුදින්නං කලන්දකපුත්තං එතදවොචුං. "උට්ඨෙහි සම්ම සුදින්න, අනුඤ්ඤාතො'සි මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. අථ ඛො සුදින්නො කලන්දකපුත්තො "අනුඤ්ඤාතො'ම්හි කිර මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති හට්ඨො උදග්ගො පාණිනා ගත්තානි පරිහුඤ්ජන්තො උට්ඨාසි. අථ ඛො සුදින්නො කලන්දකපුත්තො කතිපාහං බලං ගාහෙත්වා යෙන භගවා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සුදින්නො කලන්දකපුත්තො භගවන්තං එතදවොච. "අනුඤ්ඤාතො'ම්හි අහං භන්තෙ මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය. පබ්බාජෙතු මං භගවා"ති. අලත්ථ ඛො සුදින්නො කලන්දකපුත්තො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ච පනායස්මා සුදින්නො එවරූපෙ ධුතගුණෙ සමාදාය වත්තති. ආරඤ්ඤිකො හොති, පිණ්ඩපාතිකො, පංසුකූලිකො, සපදානචාරිකො. අඤ්ඤතරං වජ්ජිගාමං උපනිස්සාය විහරති.

( පඨමපාරාජිකං - පාරාජිකපාළි)

## පස්වන පාඩම

## උට්ඨෙහි සම්ම සුදින්න

ඉක්බිති කලන්දක පුත්‍ර වූ සුදින්නගේ යහළුවෝ කලන්දක පුත්‍ර සුදින්නගේ මාපියන් වෙත පැමිණියහ. පැමිණ කලන්දකපුත්‍ර සුදින්නගේ මාපියන්ට මෙසේ කීවෝ ය. 'මෑණියනි, පියාණනි, සුදින්න තෙමේ මෙහි ම මාගේ මරණය හෝ පැවිද්ද වන්නේය'යි කිසිවක් නො අතුළ බිමෙහි වැතිරුණේ වෙයි. ඉදින් තොපි ගිහිගෙන් නික්ම සසුන් වන්නට සුදින්නට අවසර නොදෙන්නෝහු නම් එහි ම මරණය පැමිණෙන්නේ ය. ඉදින් තොපි ගිහිගෙයින් නික්ම සසුන් වන්නට සුදින්නට අවසර නොදෙන්නෝහු නම් පැවිදි වූ ඔහු දක්නහු ය. ඉදින් සුදින්න තෙමේ ගිහිගෙයින් නික්ම සසුන් වැදී පැවිද්දෙහි සිත් නො අලවන්නේ නම්, ඔහුගේ කිනම් අනෙක් ගතියක් වන්නේ ද? මෙහි ම පෙරළා එන්නේ ය. ගිහිගෙයින් නික්ම සසුන් වැදීමට සුදින්නට අවසර දෙව් යනුවෙනි.



පදියතලාවේ ඤාණවිමල හිමි

''දරුවනි, ගිහිගෙයින් නික්ම සසුන් වැදීමට සුදින්ට අනුදනිමු.'' කීහ. ඉක්බිති කලන්දක පුත්‍ර සුදින්නගේ යහළුවෝ කලන්දක පුත්‍ර සුදින්න වෙත පැමිණියහ. පැමිණ කලන්දක පුත්‍ර සුදින්නට මෙසේ කීවෝ ය. ''යහළු සුදින්නයෙනි, නැගිටින්න. මාපියන් විසින් ගිහිගෙයින් නික්ම සසුන් වන්නට අවසර දෙනු ලැබූහ'' යනුවෙනි.

ඉක්බිති කලන්දක පුත්‍ර සුදින්න තෙමේ ''මව්පියන් විසින් ගිහිගෙයින් නික්ම සසුන් වැදීමට අනුදක්නා ලද්දේ වෙමි'යි සතුටු වූයේ ඔදවැඩී ගිය සිත් ඇත්තේ, අතින් සිරුර පිරිමදිමින් නැගී සිටියේ ය. ඉක්බිති කලන්දක පුත්‍ර සුදින්න තෙමේ කිහිප දවසක් මුළුල්ලේ කය බලගන්වා බුදුරදුන් වෙත පැමිණියේ ය. පැමිණ බුදුරදුන්ට වැඳ එකත්පසෙක හුන්නේ ය. පසෙක හුන්නා වූ කලන්දක පුත්‍ර සුදින්න තෙමේ බුදුරදුන්ට මෙසේ සැළ කළේ ය. ''වහන්ස, මම ගිහිගෙයින් නික්ම සසුන් වැදීමට මාපියන් විසින් අනුදක්නා ලද්දෙම් වෙමි. භාග්‍යවතුන් වහන්සේ මා පැවිදි කරන සේක්වා.' යනුවෙනි. කලන්දක පුත්‍ර සුදින්න තෙමේ භාග්‍යවතුන් සමීපයෙහි පැවිද්ද ලැබී ය. උපසම්පදාව ලැබී ය. උපසම්පන්න වී නොබෝ කල් ඇති සුදින්න තෙමේ මෙබඳු ධූතාංග ගුණයන් සමාදම් ව වෙසෙයි. අරණ්‍යෙහි වසන්නෙක් වෙයි. පිණ්ඩපාතික වෙයි. පාංසුකූල චීවර දරන්නෙක් වෙයි. ගෙපිළිවෙළින් පිඬු සිඟන්නෙක් වෙයි. එක්තරා වජ්ජි ග්‍රාමයක් ඇසුරු කොට වාසය කරයි.

ජටෙඨා පාඨො

# තථාගතස්ස ආළාහනං

අථ ඛො ආයස්මා මහාකස්සපො යෙන කුසිනාරා මකුටබන්ධනං නාම මල්ලානං චෙතියං, යෙන භගවතො චිතකො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකංසං චීවරං කත්වා අඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කත්වා පාදතො විවරිත්වා භගවතො පාදෙ සිරසා වන්දි. තානිපි ඛො පඤ්චභික්ඛුසතානි එකංසං චීවරං කත්වා අඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කත්වා භගවතො පාදෙ සිරසා වන්දිංසු. වන්දිතෙසු ච පනායස්මතා මහාකස්සපෙන තෙහිපි පඤ්චහි භික්ඛුසතෙහි සයමෙව චිතකො පජ්ජලි. ඣායමානස්ස ඛො පන භගවතො සරීරස්ස, යං අහොසි ඡවීති වා චම්මන්ති වා මංසන්ති වා නහාරුති වා ලසිකාති වා තස්ස නෙව ඡාරිකා පඤ්ඤායිත්ථ, න මසි, සරීරානෙව අවසස්සිංසු. සෙය්‍යථාපි නාම සප්පිස්ස වා තෙලස්ස වා ඣායමානස්ස න ඡාරිකා පඤ්ඤායිත්ථ, න මසි. සරීරානෙව අවසිස්සිංසු. තෙසඤ්ච පඤ්චන්නං දුස්සයුගසතානං ද්වෙ ච දුස්සානි න ඩය්හිංසු. යඤ්ච සබ්බබ්භන්තරිමං, යඤ්ච බාහිරං. දඩ්ඪෙ ච ඛො පන භගවතො සරීරෙ අන්තලික්ඛා උදකධාරා පාතුභවිත්වා භගවතො චිතකං නිබ්බාපෙසි. උදකං සාලතොපි අබ්භුන්නමිත්වා චිතකං නිබ්බාපෙසි. කොසිනාරකාපි මල්ලා සබ්බගන්ධොදකෙන භගවතො චිතකං නිබ්බාපෙසුං.

(මහාපරිනිබ්බාණසුත්ත - දීඝනිකාය)

## සයවැනි පාඩම

## තථාගතස්ස ආළාහනං

ඉක්බිත්තෙන් මහාකාශ්‍යප තෙරණුවෝ කුසිනාරා නුවර මකුට බන්ධන නම් මල්ලයන්ගේ චෛත්‍යය යම් තැනක ද භාග්‍යවතුන් වහන්සේගේ චිතකය යම් තැනක ද එතැනට වැඩි සේක. වැඩම කොට සිවුර එක්ලස් කොට දොහොත් නගා තුන් වටක් චිතකය පැදකුණු කොට හිස නමා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ සිරි පා වැන්දාහු ය. ඒ පන්සියයක් භික්ෂූන් වහන්සේලා ද සිවුර එකස් කොට දොහොත් මුදුන් නගා තුන් විටක් චිතකය පැදකුණු කොට හිස නමා භාග්‍යවත් බුදුරදුන්ගේ සිරි පා නැමදූහ. මහාකාශ්‍යප තෙරුන් විසින් ද ඒ පන්සියයක් භික්ෂූන් විසින් ද භාග්‍යවතුන් වහන්සේගේ සිරි පා වඳනා ලද කල්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ චිතකය තෙමේ ම ගිනි ගත්තේ ය.

දැවෙන්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරය සිවිය හෝ සම හෝ මස් හෝ නහර හෝ සඳමිදුළු හෝ යමෙක් වේ ද එහි අළු නොම වීය. ශාරීරික ධාතුහුම ඉතිරි වූහ. යම් සේ දැවෙන ගිතෙල හෝ තලතෙල අළු නොම පැනේ ද දැලි නොම පැනේ ද එසේ ම දැවෙන භාග්‍යවත් බුදුරදුන්ගේ ශ්‍රී ශරීරය සිවියැයි හෝ සම යැයි හෝ මස යැයි හෝ නහර යැයි හෝ සඳමිදුලු යැයි හෝ යමෙක් ඉතිරි වී ද එහි අළු ද නොපෙනිණි. දැලි ද

නොපෙණිනි. ශාරීරික ධාතුහුම ඉතිරි වූහ. ඒ පන්සියයක් වස්ත්‍ර යුගලයන් අතුරෙන් යම් වස්ත්‍රයක් සැමට යටින් වී ද, යම් වස්ත්‍රයක් සැමට පිටින් වී ද ඒ වස්ත්‍ර දෙක ම නොදැවිණි. භාග්‍යවත් බුදුරදුන්ගේ ශ්‍රී ශරීරය දැවුණු කල්හි අහසින් දිය දහර පහළ ව චිතකය නිවී ය. වටා සිටි සල්රුක් හි අතු පතරින් ද ජලය මතු වී චිතකය නිවී ය. කුසිනාරා වාසී මල්ල රජදරුවෝ ද සැම වර්ගයේ සුවඳ කැවූ සුවඳ දියෙන් භාග්‍යවතුන් වහන්සේගේ චිතකය නිවූහ.

## සත්තමො පාඨො

# පස්සථ අය්‍යා උපසන්තාය කම්මං

භූතපුබ්බං භික්ඛවෙ, ඉමිස්සායෙව සාවත්ථියා වෙදෙහිකා නාම ගහපතානී අහොසි. වෙදෙහිකාය භික්ඛවෙ ගහපතානියා එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතොඃ සොරතා වෙදෙහිකා ගහපතානි, නිවාතා වෙදෙහිකා ගහපතානි, උපසන්තා වෙදෙහිකා ගහපතානීති. වෙදෙහිකාය ඛො පන භික්ඛවෙ ගහපතානියා කාළී නාම දාසී අහොසි, දක්ඛා අනලසා සුසංවිහිතකම්මන්තා. අථ ඛො භික්ඛවෙ කාළියා දාසියා එතදහොසිඃ මය්හං ඛො අය්‍යාය එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතොඃ සොරතා වෙදෙහිකාය ගහපතානී, නිවාතා වෙදෙහිකා ගහපතානී, උපසන්තා වෙදෙහිකා ගහපතානීති. කින්නු ඛො මෙ අය්‍යා සන්තංයෙව නු ඛො අජ්ඣත්තං කොපං න පාතුකරොති? උදාහු අසන්තං? උදාහු මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා, යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති? නො අසන්තං? යන්නූනාහං අය්‍යං වීමංසෙය්‍යන්ති. අථ ඛො භික්ඛවෙ කාළී දාසී දිවා උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානී කාළිං දාසිං එතදවොච. හෙ ජෙ කාළීති. කිං අය්‍යෙති? කිං ජෙ දිවා උට්ඨාසීති? 'න ඛො අය්‍යෙ කිඤ්චීති.' නො වත රෙ කිඤ්චි පාපී දාසී දිවා උට්ඨාසී'ති කුපිතා අනත්තමනා භාකුටිං අකාසි.

අථ ඛො භික්ඛවෙ කාළියා දාසියා එතදහොසිඃ සන්තංයෙව ඛො මෙ අය්‍යා අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා, යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං. යන්නූනාහං භිය්‍යොසොමත්තාය අය්‍යං විමංසෙය්‍යන්ති අථ ඛො භික්ඛවෙ කාළී දාසී දිවාතරං උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානි කාළිං දාසිං එතදවොචඃ හෙ ජෙ කාළීති. 'කිං අය්‍යෙ'ති? කිං ජෙ දිවාතරං උට්ඨාසීති? 'න ඛො අය්‍යෙ කිඤ්චී'ති. නො වත රෙ කිඤ්චි පාපී දාසී, දිවාතරං උට්ඨාසීති කුපිතා අනත්තමනා අනත්තමනවාචං නිච්ඡාරෙසි. අථ ඛො භික්ඛවෙ කාළියා දාසියා එතදහොසිඃ සන්තංයෙව ඛො මෙ අය්‍යා අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං, මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති, නො අසන්තං. යන්නූනාහං භිය්‍යොසොමත්තාය අය්‍යං වීමංසෙය්‍යන්ති. අථ ඛො භික්ඛවෙ කාළී දාසී දිවාතරංයෙව උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානි කාළිං දාසිං එතදවොච. හෙ ජෙ කාළීති. 'කිං අය්‍යෙති? කිං ජෙ දිවාතරං උට්ඨාසීති? න ඛො අය්‍යෙ කිඤ්චීති. නො වත රෙ කිඤ්චි පාපී දාසී, දිවාතරං උට්ඨාසීති කුපිතා අනත්තමනා අග්ගළසූචිං ගහෙත්වා සීසෙ පහාරං අදාසි. සීසං වොභින්දි. අථ ඛො භික්ඛවෙ කාළී දාසී භින්නෙන සීසෙන ලොහිතෙන ගළන්තෙන පටිවිස්සකානං උජ්ඣාපෙසිඃ 'පස්සථය්‍යා සොරතාය කම්මං, පස්සථය්‍යා නිවාතාය කම්මං, පස්සථය්‍යා උපසන්තාය කම්මන්ති.

(කකචූපම සුත්ත - මජ්ඣිමනිකාය)

## සත්වන පාඩම

## පස්සථ අය්‍යා උපසන්තාය කම්මං

මහණෙනි, පෙර වූවක් කියමි. මේ සැවැත්නුවරම වේදේහිකා නම් ගෘහපතිනියක් වූවා ය. මහණෙනි, වේදේහිකා ගෘහපතිනියගේ මෙබඳු කල්‍යාණ කීර්ති ශබ්දයක් පැන නැගිණි. වේදේහිකා ගෘහපතිනිය දැමුණු ඉඳුරන් ඇත්තී ය. වේදේහිකා ගෘහපතිනිය යටත් පැවතුම් ඇත්තී ය. වේදේහිකා ගෘහපතිනිය ශාන්ත ය. කියා ය. මහණෙනි,

වේදේහිකා ගෘහපතිනියට කාළි නම් දාසියක් විය. දක්ෂය. අනලස් ය. මනාව සංවිධානය කළ කටයුතු ඇත්තී ය.

මහණෙනි, කාළී දාසියට ''මාගේ ආර්යාව පිළිබඳව -වේදේහිකා ගෘහපතිනිය සුරතභාවයෙන් යුක්තයි, වේදේහිකා ගෘහපතිනිය යටපත් පැවතුම් ඇත්තී ය. වේදේහිකා ගෘහපතිනිය උපශාන්තය යැයි කල්‍යාණ කීර්ති ශබ්දයක් පැන නැගිණි. කිමෙක් දෝ? මාගේ ආර්යාව තමා තුළ ඇත්තා වූ කෝපය පහළ නොකෙරේ ද? නැතහොත් නැත්තා වූහ කෝපය පහළ නොකෙරේ ද? එසේත් නැතහොත් යම් හෙයකින් මවිසින් ම සැම කර්මාන්තයෝ මැනවින් කරන ලදහුද එහෙයින් මාගේ ආර්යා තොමෝ තමා තුළ ඇත්තා වූ ම කෝපය පහළ නොකෙරේ ද විමසා බලන්මේ නම් ඉතා මැනවි යැයි මේ සිත විය. මහණෙනි, ඉක්බිති කාළී දාසී තොමෝ දහවල් කොට නැගී සිටියා ය. මහණෙනි, ඉක්බිති වේදේහිකා ගෘහණී තොමෝ කාළී දාසියට මෙය කිවූය. ''එම්බල කාළිය, ආර්යාවෙනි, කිම? එම්බල කෙල්ල, කිම, දහවල් කොට නින්දෙන් නැගිට්ටෙහි ද? 'ආර්යාවෙනි, කිසිත් නැත, එම්බල පව්ටු දාසිය, කිසිත් නැත්නම් දහවල් කොට නැගී සිටියෙහි ද? යැයි කෝප වූවා නොසතුටු වූවා මුහුණ හැකිළී ය.

මහණෙනි, එකල කාළී දාසියට මේ අදහස විය. ''මාගේ ආර්යාව තමා තුළ ඇත්‍ා වූ ම කෝපය පහළ නොකරන්නී ය. නැත්තා වූ ම කෝපය පහළ නොකරන්නී නොවේ. යම් හෙයකින් මා විසින් ම තෙල කර්මාන්තයෝ මැනවින් කරන ලද්දේ වීම් ද ඒ නිසා ආර්යා තොමෝ තමා තුළ ඇත්තා වූ ම කෝපය පහළ නොකෙරේ ද, නැත්තා වූ ම කෝපය පහළ නොකෙරේදැයි මම ආර්යාව බොහෝ සේ විමසා බලන්නෙමි නම් යෙහෙකි' කියා ය. මහණෙනි, ඉක්බිති කාළී දාසිය වඩාත් දහවල් කොට නින්දෙන් නැගී සිටියා ය.

මහණෙනි, ඉක්බිති වේදේහිකා ගෘහපතිනිය කාළී දාසියට මෙසේ කීවා ය. 'එම්බල කෙල්ල, කාළිය. 'කිම ද ආර්යාවෙනි, කෙල්ල කුමක් නිසා ඉතා දහවල් කොට නැගී සිටිහි ද?, ආර්යාවෙනි කිසිත් නැත' ''එම්බල පව්ටු දාසිය කිසිවක් නැතිව දහවල් කොට නැගිට්ටා දැයි' කිපියා වූ නොසතුටු වූවා නොසතුටු වචන පිට කළාය. එකල කාළී දාසියට මේ අදහස ඇති විය. 'මාගේ ආර්යාව තමා තුළ ඇත්තා වූ ම කෝපය පහළ නොකරන්නී ය. නැත්තා වූ කෝපය පහළ නොකරන්නී නොවෙයි. යම් හෙයකින් මා විසින් ඒ කර්මාන්ත මනාව කරන්නී ද ඒ නිසා ආර්යා තොමෝ තමා තුළ ඇත්තා වූ ම කෝපය පහළ නොකෙරේ ද නැත්තා වූ හ කෝපය පහළ නොකෙරේ දැයි මම ආර්යාව තවත් බොහෝ කොට විමසා බලන්නෙම් නම් මැනවැයි කියායි. මහණෙනි, ඉක්බිති කාළී දාසිය පෙරටත් වඩා දහවල් කොට නැගී සිටියා ය. මහණෙනි, ඉක්බිති වේදේහිකා ගෘහපතිනි තොමෝ කාළී දාසියට මෙසේ කීවා ය. 'එම්බල කාළිය, ආර්යාවෙනි, කිම? කෙල්ල කුමක් නිසා පෙරටත් වඩා දහවල් කොට නැගී සිටියෙහි ද? ආර්යාවෙනි, කිසිත් නැත. එම්බල පව්ටු දාසිය, කිසිත් නැත්ම් පෙරටත් වඩා දහවල් කොට නැගී සිටියෙහි දැයි කිපී නොසතුටු වූවාහු දොරඅගුල ගෙන හිසට පහරක් දුන්නා ය. හිස පැළුවා ය. මහණෙනි, ඉක්බිති කාළී දාසිය පැළුණු හිසින් ද ගලන ලෙයින් ද යුතුව අසල්වැසියන්ට අඬ ගා නුගුණ කීවා ය. ආර්යයෙනි දැමුණු ඉඳුරන් ඇති ස්ත්‍රියගේ ක්‍රියාව බලව. යටහත් පැවතුම් ඇත්තියගේ ක්‍රියාව බලව. උපශාන්ත තැනැත්තියගේ ක්‍රියාව බලව' යනුවෙනි.

අත්වැළ

අට්ඨමො පාඨො

# බ්‍රහ්මාති මාතාපිතරො

සබ්‍රහ්මකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සපුබ්බදෙවතානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සපුබ්බාචරියකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සාහුණෙය්‍යකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. බ්‍රහ්මාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං. පුබ්බදෙවතාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං. පුබ්බාචරියාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං. ආහුණෙය්‍යාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං. තං කිස්ස හෙතු? බහූපකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං, ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරොති. එතමත්ථං භගවා අවොච. තත්ථේතං ඉති වුච්චති.

බ්‍රහ්මාති මාතාපිතරො - පුබ්බාචරියාති වුච්චරෙ
ආහුණෙය්‍යා ච පුත්තානං - පජාය අනුකම්පකා

තස්මා හි නෙ නමස්සෙය්‍ය - සක්කරෙය්‍යාථ පණ්ඩිතො
අන්නෙන අථ පානෙන - වත්ථේන සයනෙන ච
උච්ඡාදනෙ නහාපනෙ - පාදානං ධොවනෙන ච

තාය නං පාරිචරියාය - මාතාපිතූසු පණ්ඩිතා
ඉධෙව නං පසංසන්ති - පෙච්ච සග්ගෙ ච මොදති.

(ඉතිවුත්තකපාළි)

## අටවැනි පාඩම

## බ්‍රහ්මාති මාතාපිතරො

මහණෙනි, යම් කුල පුත්‍ර කෙනෙකුන් විසින් මවුපිය දෙදෙන ස්වකීය ගෘහයෙහි පුදන ලද්දාහු වෙද්ද, ඒ කුලයෝ බ්‍රහ්මයා සහිතයෝ වෙති. මහණෙනි, යම් පුත්‍ර කෙනෙකුන් විසින් මව්පිය දෙදෙන ස්වකීය ගෘහයෙහි පුදන ලද්දාහු වෙද්ද, ඒ කුලයෝ පූර්ව දේවතාවන් සහිත වෙති. මහණෙනි, යම් පුත්‍ර කෙනෙකුන් විසින් මව්පිය දෙදෙන ස්වකීය ගෘහයෙහි පුදන ලද්දාහු වෙද්ද හ් කුලයෝ පූර්වාචාර්යයන් සහිතයෝ වෙති. මහණෙනි යම් පුත්‍ර කෙනෙකුන් විසින් මව්පිය දෙදෙන ස්වකීය ගෘහයෙම් පුදන ලද්දාහු වෙද්ද ඒ කුලයෝ පමුණුවා දන් දිය යුත්තන් සහිතයෝ (සාහුණෙය්‍ය) වෙති.

මහණෙනි බ්‍රහ්ම යන මෙය මවුපියන්ට නමකි. මහණෙනි පූර්වදේව යන මෙය මව්පියන්ට නමකි. මහණෙනි පූර්ව ආචාර්ය යන මෙය මව්පියන්ට නමකි. මහණෙනි ආහුණෙය්‍ය යන මෙය මව්පියන්ට නමකි. ඒ කවර හෙයින් ද යත්?

මහණෙනි මව්පිය දෙදෙන පුත්‍රයන්ට බොහෝ උපකාර ඇත්තෝ වෙති. ජීවිත අරක්ෂකයෝ වෙති. අත් පා වඩා පෝෂණය කරන්නෝ වෙති. මෙලොව ඉෂ්ට අනිෂ්ට අරමුණු දක්වන්නෝ වෙති.

මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ. (ගාථා වශයෙන්)

1. පුත්‍ර ප්‍රජාවට අනුකම්පා කරන මව්පිය දෙදෙනා පුත්‍රයන්ට බ්‍රහ්මයෝ යැයි ද පූර්ව ආචාර්යවරයෝ යැයි ද දුරින් ගෙනවුත් දිය යුතු ආහාරයන්ට සුදුසු (ආහුණෙය්‍ය) යැයි ද කියනු ලැබෙති.

2. එහෙයින් නුවණැති පුද්ගල තෙමේ ඒ මව්පියන්ට නමස්කාර කරන්නේ ය. යළි ආහාරයෙන් පානයෙන් ද වස්ත්‍රයෙන් ද සයනයෙන් ද ඇඟ ඉලීමෙන් ද නැහැවීමෙන් ද පා දෙවීමෙන් ද සත්කාර කරන්නේ ය.

3. පණ්ඩිතයෝ මව්පියන් කෙරෙහි ඒ (අත්පා මෙහෙකිරීම් ආදි) උවටැන් කිරීම නිසා මෙලොව දී ඔහු පසසති. මරණින් මතු ස්වර්ගයෙහි ඉපිද අතිශයින් සතුටු වේ. යනුවෙනි.

## නවමො පාඨො

# කස්මා ලිච්ඡවීති වදන්ති?

තෙන ච සමයෙන අඤ්ඤතරො තාපසො ගොපාලකුලං නිස්සාය ගඞ්ගාතීරෙ විහරති. සො පාතොව ගඞ්ගං ඔතරන්තො භාජනං ආගච්ඡන්තං දිස්වා පංසුකූලසඤ්ඤාය අග්ගහෙසි. තතො තත්ථ තං අක්ඛරපට්ටකං රාජමුද්දිකාලඤ්ඡනඤ්ච දිස්වා මුඤ්චිත්වා තං මංසපෙසිං අද්දස. දිස්වානස්ස එතදහොසි. 'සියා ගබ්භො. තථා හිස්ස දුග්ගන්ධපූතිභාවො නත්ථී'ති. තං අස්සමං නෙත්වා සුද්ධෙ ඔකාසෙ ඨපෙසි. අථ අඩ්ඪමාසච්චයෙන ද්වෙ මංසපෙසියො අහෙසුං. තාපසො දිස්වා සාධුතරං ඨපෙසි. තතො පුන අඩ්ඪමාසච්චයෙන එකමෙකිස්සා පෙසියා හත්ථපාදසීසානමත්ථාය පඤ්ච පඤ්ච පීළකා උට්ඨහිංසු. තාපසො දිස්වා පුන සාධුතරං ඨපෙසි. අථ අඩ්ඪමාසච්චයෙන එකා මංසපෙසි සුවණ්ණබිම්බසදිසො දාරකො. එකා දාරිකා අහොසි. තෙසු තාපසස්ස පුත්තසිනෙහො උප්පජ්ජි. අඞ්ගුට්ඨකතො චස්ස ඛීරං නිබ්බත්ති. තතොප්පභුති ච ඛීරභත්තං ලභති. සො භත්තං භුඤ්ජිත්වා ඛීරං දාරකානං මුඛෙ ආසිඤ්චති. තෙසං යං යං උදරං පවිට්ඨං, තං සබ්බං මණිභාජනගතං විය දිස්සති. එවං ලිච්ඡවී අහෙසුං. එවං තෙ නිච්ඡවිතාය ලිච්ඡවීති පඤ්ඤායිංසු.

(ඛුද්දකපාඨට්ඨකථා)

## නවවැනි පාඩම

## කස්මා ලිච්ඡවීති වදන්ති

එකල්හි එක්තරා තාපසයෙක් ගොපලු කුලයක් ඇසුරු කොට ගං තෙර වාසය කරයි. ඔහු උදෑසනම ගඟට බැස්සේ ඒ භාජනය ගසාගෙන එනු දැක පාංශුකූල සංඥාවෙන් හෙවත් අයිතිකරුවෙකු නැතැයි යන හැඟීමෙන් ගත්තේ ය. ඉක්බිති එහි අක්ෂර පත්‍රිකාවත් රාජ මුද්‍රිකා ලාංඡනයත් දැක විවෘත කොට එහි ඇති මස් වැදැල්ල දැක්කේ ය. දැක ඔහුට මෙසේ සිත් විය. ''දරු ගැබක් විය යුතුය. එසේ වුවත් මෙහි දුගඳක් හෝ කුණු වූ බවක් හෝ නොමැත.'' යනුවෙනි. අසපුවට ගෙන ගොස් පිරිසිදු තැනක තැබී ය. ඉක්බිති අඩමසක් ඇවෑමෙන් එක් එක් වැදැල්ලක අත්පා හිස සඳහා බිබිලි පහ බැගින් පැන නැංගේ ය. ඉක්බිති තවත් අඩමසක් ඇවෑමෙන් එක් මස් වැදැල්ලක රන් පිළිමයක් හා සමාන දරුවෙක් විය. අනෙක දැරියක් වූවා ය. ඔවුන් කෙරෙහි තාපසයාට දරු සෙනෙහස පහළ විය. ඔහුගේ ඇඟිල්ලෙන් කිරි එරුණි. එතැන් පටන් කිරි හා බත් ලබයි ද ඔහු බත් අනුභව කොට කිරි දරුවන්ට පොවයි. ඒ දරුවන්ගේ උදරයට යමක් යමක් පිවිසෙන්නේ වේ ද ඒ සියල්ල මැණික් බඳුනක දැමූවක් සේ පෙනෙන්නේ ය. මෙසේ ඡවි හෙවත් උඩසම නැත යන අර්ථයෙන් නිච්ඡවි වූහ. සමහරු මෙසේ කීහ. මසා තැබුවාක් මෙන් ඔවුනොවුන්ගේ සම අප්‍රකට විය. මෙසේ ඔවුහු සමෙන් තොර වූ නිසා හෝ අප්‍රකට සම ඇති බැවින් හෝ 'ලිච්ඡවි' යයි ප්‍රකට වූහ යනුවෙනි.

# දසමො පාඨො

# සබ්බං කිර පහාය ගන්තබ්බං

සෙතව්‍යවාසිනො හි චූළකාලො මජ්ඣිමකාලො මහාකාලොති තයො භාතරො කුටුම්බිකා. තෙසු ජෙට්ඨකනිට්ඨා දිසාසු විචරිත්වා සකටෙහි භණ්ඩං ආහරන්ති. මජ්ඣිමකාලො ආභතං වික්කිණාති. අථෙකස්මිං සමයෙ තෙ උභොපි භාතරො පඤ්චහි සකටසතෙහි නානා භණ්ඩං ගහෙත්වා සාවත්ථිං ගන්ත්වා සාවත්ථියා ච ජෙතවනස්ස ච අන්තරෙ සකටානි මොචයිංසු. තෙසු මහාකාලො සායණ්හසමයං මාලාගන්ධාදිහත්ථෙ සාවත්ථිවාසිනො අරියසාවකෙ ධම්මසවණත්ථාය ගච්ඡන්තෙ දිස්වා "කුහිං ඉමෙ ගච්ඡන්තී"ති පුච්ඡිත්වා තමත්ථං සුත්වා 'අහම්පි ගමිස්සාමී'ති චින්තෙත්වා කනිට්ඨං ආමන්තෙත්වා, "තාත සකටෙසු අප්පමත්තො හොහි. අහං ධම්මං සොතුං ගච්ඡාමී"ති වත්වා තථාගතං වන්දිත්වා පරිසපරියන්තෙ නිසීදි. සත්ථා තං දිස්වා අජ්ඣාසයවසෙන ආනුපුබ්බිකථං කථෙන්තො දුක්ඛක්ඛන්ධසුත්තාදිවසෙන අනෙකපරියායෙන කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං ච කථෙසි. තං සුත්වා මහාකාලො සබ්බං කිර පහාය ගන්තබ්බං, පරලොකං ගච්ඡන්තං නෙව භොගා න ඤාතයො අනුගච්ඡන්ති. කිමෙම ඝරාවාසෙන, පබ්බජිස්සාමීති චින්තෙසි.

(චූළකාලමහාකාලවත්ථු - ධම්මපදට්ඨකථා)

## දසවැනි පාඩම

## සබ්බං කිර පහාය ගන්තබ්බං

සෙතව්‍ය නගරවාසී චූළකාල මජ්ඣිම කාල මහාකාල යයි කෙළෙඹි පුත්‍රයෝ තිදෙනෙක් විසූහ. එයින් වැඩිමහලු බාල දෙදෙන ඒ ඒ දිනවල ගොස් ගැල්වලින් බඩු ආනයනය කරති. මජ්ඣිමකාල ගෙනා බඩු විකුණයි. පසුකලක මේ සහෝදරයන් දෙදෙනා ගැල් පන්සියයක නොයෙක් බඩු පටවාගෙන සැවැත්නුවරට ගොස් සැවැත්නුවරත් ජේතවනාරාමයත් අතර ගැල් මිදුවාහු ය. ඔවුන්ගෙන් මහාකාල සවස් වරුවෙහි සුවඳ මල් ආදිය රැගෙන බණ අසනු පිණිස යන සැවැත්නුවර වාසී ආර්යශ්‍රාවකයන් දැක මේ අය කොහේ යන්නහුදැයි අසා දැනගෙන තමනුත් යායුතුයයි සිතා බාල සොහොයුරාට කතා කොට, දරුව ගැල් පිළිබඳ සැලකිලිමත් වන්න. මම බණ ඇසීමට යන්නෙහි, යි කියා ගොස් බුදුන් වැඳ පිරිස් කෙළවර හුන්නේ ය.

බුදුරජාණන් වහන්සේ ඔහු දැක ඔහුට ගැළපෙන පරිදි පිළිවෙළ කතාව දේශනා කරමින් දුක්ඛක්ඛන්ධ ආදි නොයෙක් ආකාරයෙන් කාමයන්ගේ දෝෂ ද ලාමක බව ද කිළුටු සහිත බව ද ප්‍රකාශ කළහ. ඒ අසා සිටි මහාකාල තෙමේ. සියල්ල හැරදමා යා යුතුය. පරලොව යන්නෙකු සමග වස්තු ද නෑයෝ ද පිටුපසින් නො එත්. මේ ගෘහවාසයෙන් මට වැඩක් නැත. පැවිදි වන්නෙමි'යි සිතා.

## එකාදසමො පාඨො

# ආහඤ්ඡං අමතදුන්දුභිං

තස්ස මය්හං රාජකුමාර; එතදහොසි කස්ස නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං? කො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතීති? තස්ස මය්හං; රාජකුමාර; එතදහොසි. බහුකාරා ඛො මෙ පඤ්චවග්ගියා භික්ඛූ යෙ මං පධානපහිතත්තං උපට්ඨහිංසු. යන්නූනාහං පඤ්චවග්ගියානං භික්ඛූනං පඨමං ධම්මං දෙසෙය්‍යන්ති. තස්ස මය්හං; රාජකුමාර, එතදහොසි; කහං නු ඛො එතරහි පඤ්චවග්ගියා භික්ඛූ විහරන්තීති. අද්දසං ඛ්වාහං; රාජකුමාර, දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන පඤ්චවග්ගියෙ භික්ඛූ බාරාණසියං විහරන්තෙ ඉසිපතනෙ මිගදායෙ. අථ ඛ්වාහං, රාජකුමාර, උරුවෙලායං යථාභිරන්තං විහරිත්වා යෙන බාරාණසී තෙන චාරිකං පක්කමිං. අද්දසා ඛො මං; රාජකුමාර, උපකො ආජීවකො අන්තරා ච ගයං අන්තරා ච බොධිං අද්ධානමග්ගපටිපන්නං. දිස්වාන මං එතදවොච. විප්පසන්නානි ඛො තෙ; ආවුසො, ඉන්ද්‍රියානි, පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. කංසි ත්වං, ආවුසො, උද්දිස්ස පබ්බජිතො? කො වා තෙ සත්ථා? කස්ස වා ත්වං ධම්මං රොචෙසීති? එවං වුත්තෙ; අහං; රාජකුමාර, උපකං ආජීවකං ගාථාහි අජ්ඣභාසිං.

සබ්බාභිභූ සබ්බවිදූහමස්මි, සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො, සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං.

න මෙ ආචරියො අත්ථි, සදිසො මෙ න විජ්ජති
සදෙවකස්මිං ලොකස්මිං, නත්ථි මෙ පටිපුග්ගලො.

අහඤ්හි අරහා ලොකෙ, අහං සත්ථා අනුත්තරො
එකොම්හි සම්මාසම්බුද්ධො, සීතිභූතොස්මි නිබ්බුතො.

ධම්මචක්කං පවත්තෙතුං, ගච්ඡාමි කාසිනං පුරං
අන්ධභූතස්මිං ලොකස්මිං, ආහඤ්ඡං අමතදුන්දුභින්ති.

(බොධිරාජකුමාරසුත්ත - මජ්ඣිමනිකාය)

## එකොළොස්වන පාඩම

## ආහඤ්ඡං අමතදුන්දුභිං

රජ කුමරුවෙනි,මට මෙසේ සිත් වීය. ''මම කවරෙක්හට පළමු කොට දහම් දෙසම් ද? කවරෙක් මේ දහම වහා දැන ගන්නේ දැයි''. රජකුමරුවෙනි, මට මෙසේ සිත් විය. ''පධන් පිණිස මෙහෙය වූ සිත් ඇති මට උවටැන් කළ පස්වග මහණුන් මට බොහෝ උපකාර ඇතියහ. මම පස්වග මහණුන්ට පළමු කොට දහම් දෙසම් නම් මනා ම ය. රජකුමරුවෙනි. මට මෙසේ සිත් විය. පස්වග මහණහු මේ කල්හි කොහි වාසය කරත් ද කියායි. රජකුමරුවෙනි, මම පිරිසිදු මිනිස් ඇස ඉක්ම දිවසින් පස්වග මහණුන් බරණැස ඉසිපතන නම් මිගදායේ වාසය කරන බැව් දුටුවෙමි. රජකුමරුවෙනි. ඉක්බිති මම උරුවෙල් දනව්වෙහි කැමතිතාක් වාසය කොට බරණැස කරා චාරිකාවට නික්මිණිමි.



පදියතලාවේ ඤාණවිමල හිමි

රජ කුමරුවෙනි, උපක නම් ආජීවක ගයාව හා බෝධිය හා අතර තුර මඟට මා දැක්කේ ය. දැක මට මෙසේ කීවේ ය. ''ඇවැත්නි, තොපගේ ඉඳුරන් ප්‍රසන්න ය. ඡවිවර්ණය පරිශුද්ධ ය. සුසුදු ය. ඇවැත්නි, තෙපි කවර ශාස්තෘවකු උදෙසා පැවිදි වූයේ ද? තොපගේ ශාස්තෘ කවරහු ද? තෙපි කවරක්හුගේ දහමක් කැමති වෙහි ද? රජකුමරුවෙනිඵ මෙසේ කී කල උපක ආජීවක හට ගාථාවෙන් කීවෙමි.

''මම හැම ත්‍රෛභූමක ධර්මය මැඩගෙන සිටියෙමි. හැම චාතුර්භූමක දහම දත්මි. හැම ත්‍රෛභූමක ධර්මයෙහි ක්ලේශලේපනයෙන් උපලිප්ත නොවෙමි. හැම ත්‍රෛභූමක ධර්ම හැරපියා සිටිමි. තෘෂ්ණාකාය සංඛ්‍යාත නිවනෙහි අරමුණු විසින් විමුක්තියෙමි. මෙසේ තමා විසින් ම හැම චාතුර්භූමක ධර්ම දැනගෙන අන් කවරක්හු නම් ගෙන (මේ මා ආචාර්යය හ'යි) උදෙසම් ද?

(ලෝකෝත්තර ධර්මයෙහි ලා) මට ගුරුවරයෙක් නැත. මට සමයෙක් නැත සදේවක ලෝකයෙහි මට සදෘශ පුද්ගලයෙක් නැත.

මම වනාහි ලෝකයෙහි අර්හත් වෙමි. මම අනුත්තර ශාස්තෘවෙමි. එකලාව සිටි සම්‍යග් සම්බුද්ධ වෙමි. සියලු කෙලෙසුන් නැසූ හේතුවෙන් ශීතිභූතයෙමි. (එයින් ම) නිර්වෘතයෙමි.

'දම්සක් පවත්වන්නට කසීපුර යෙමි. අන්ධභූත ලෝකයෙහි අමා බෙර වයන්නෙමි' යනුවෙනි.

ඇවැත්නි, තොප යම් සේ පිළින කරවූ ද එසේ හෙයින් අනන්ත ජින වන්නට නිසි ය.

# ද්වාදසමො පාඨො

# තථාගතසස මහිද්ධිකතා මහානුභාවතා

එකං සමයං භගවා මලෙලසු චාරිකං චරමානො මහතා භිකඛුසංඝෙන සදධිං යෙන ථූනං නාම මලලානං බ්‍රාහමණගාමො තදවසරි. අසෙසාසුං ඛො, ථූනෙයයකා බ්‍රාහමණගහපතිකා 'සමණො ඛලු භො ගොතමො සකයපුතෙතා සකයකුලා පබබජිතො මලෙලසු චාරිකං චරමානො මහතා භිකඛුසංඝෙන සදධිං ථූනං අනුපපතෙතා'ති. උදපානං තිණසස ච භුසසස ච යාව මුඛතො පූරෙසුං 'මා තෙ මුණඩකා සමණකා පානීයං අපංසූ'ති. අථ ඛො භගවා මගගා ඔකකමම යෙන රුකඛමූලං තෙනුපසඞකමි. උපසඞකමිතවා පඤඤතෙත ආසනෙ නිසීදි. නිසජජ ඛො භගවා ආයසමනතං ආනනදං ආමනෙතසි. 'ඉඞඝ මෙ තවං ආනනද, එතමහා උදපානා පානීයං ආහරා'ති. එවං වුතෙත, ආයසමා ආනනෙදා භගවනතං එතදවොච. ඉදානි සො, භනෙත, උදපානො ථූනෙයයකෙහි බ්‍රාහමණගහපතිකෙහි තිණසස ච භුසසස ච යාව මුඛතො පූරිතො 'මා තෙ මුණඩකා සමණකා පානීයං අපංසූ'ති. දුතියමපි ඛො............ අපංසූ'ති. තතියමපි ඛො භගවා ආයසමනතං ආනනදං ආමනෙතසි. ඉඞඝ මෙ තවං ආනනද, එතමහා උදපානා පානීයං ආහරා'ති. එවං, භනෙතති ඛො ආයසමා ආනනෙදා භගවතො පටිසසුතවා පතතං ගහෙතවා යෙන සො උදපානො තෙනුපසඞකමි. අථ ඛො සො උදපානො ආයසමනෙත ආනනෙද උපසඞකමනෙත සබබං තං තිණඤච භුසඤච මුඛතො ඔවමිතවා අචඡසස උදකසස අනාවිලසස විපපසනනසස යාව මුඛතො පූරිතො විසසනෙදනෙතා මඤෙඤ අටඨාසි. අථ ඛො ආයසමතො ආනනදසස එතදහොසි. අචඡරියං වත! භො, අබභුතං වත! භො, තථාගතසස මහිදධිකතා මහානුභාවතා. අයං හි සො උදපානො මයි උපසඞකමනෙත සබබං තං තිණඤච භුසඤච මුඛතො ඔවමිතවා අචඡසස උදකසස අනාවිලසස විපපසනනසස යාව මුඛතො පූරිතො විසසනෙදනෙතා මඤෙඤ අටඨාසීති. පතෙතන පානීයං ආදාය යෙන භගවා තෙනුපසඞකමි.

(උදපානසුතත - උදානපාළි )

## දොළොස්වැනි පාඩම

## තථාගතසස මහිද්ධිකතා මහානුභාවතා

එක් සමයක භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂු සංඝයා සමග මල්ල රට සැරි සරන සේක, මල්ලයන්ගේ ථූන නම් වූ බමුණුගමට වැඩම කළ සේක. ශාක්‍ය පුත්‍ර වූ ශාක්‍ය කුලයෙන් පැවිදි වූ මහණ ගෞතමයන් වනාහි මහත් භික්ෂු සංඝයා සමග මල්ල රට සැරිසරණුවෝ ථූන ගමට පැමිණියාහුයැයි ථූන ගම්වැසි බමුණු ගෘහපතියෝ ඇසූහ. ඔහු ඒ මුඩු මහණහු පැන් නොබොත්වයි තණකොළින් ද පිදුරෙන් ද ළිඳ මුවවිට දක්වාට පිරවූහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මාර්ගයෙන් ඉවත් වී එක්තරා රුක්මුලක් කරා වැඩම කළ සේක. එළඹ පණවන ලද ආසනයෙහි වැඩ හුන් සේක. වැඩ හිඳම භාග්‍යවතුන් වහන්සේ ආනන්ද තෙරුන්ට කතාකොට 'ආනන්දයෙනි, තෙල ළිඳෙන් මට පැන් ගෙනෙව'යි වදාළ සේක. එසේ වදාළ කල්හි ආනන්ද තෙරණුවෝ 'වහන්ස, ඒ මුඩු මහණහු පැන් නොබොත්වයි' කියා ථූන ගම් වැසි බමුණු ගෘහපතියන් විසින් ඒ ළිඳ

තණකොළින් හා පිදුරෙන් මුවවිට දක්වාම දැන් පුරවන ලදැයි සැළකළ සේක. දෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ ආනන්ද තෙරුන් අමතා ඉහත පරිදි පැවසූ සේක. දෙවෙනි වර ද ආනන්ද තෙරණුවෝ පෙර පරිදි ම 'පැන් නොබොත්වයි' තණකොළිනුත් පිදුරෙනුත් ළිඳේ මුවවිට දක්වාම පුරවන ලදැයි සැල කළේ ය. තෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ 'ආනන්දයෙනි' තෙල ළිඳෙන් මට පැන් ගෙනෙව'යි වදාළ සේක. 'එසේය වහන්ස' කියා ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී පාත්‍රය ගෙන ඒ ළිඳ කරා එළඹී සේක.

එකල්හි ඒ ළිඳ ආනන්ද තෙරුන් වෙත එළඹෙන විට ඒ සියලු තණකොළත් පිදුරුත් මුවවිටින් බැහැර කොට මුවවිට දක්වාම පිරිසිදු නොකැළඹුණු විශේෂයෙන් පෑදුණු දියෙන් පිරුණේ පිටතට දිය නික්මවන්නක්හු මෙන් සිටියේ ය. එකල්හි ආනන්ද තෙරණුවන් හට පින්වත්නි තථාගතයන් වහන්සේගේ මහත් ඍද්ධි ඇති නියාව මහත් ආනුභාව ඇති නියාස ආශ්චර්ය ය. අද්භූත ය. මේ ළිඳ මා එළඹෙන කල්හි සියලු තණකොළත් පිදුරුත් මුවවිටින් බැහැර කොට පියා පිරිසිදු නොකැළඹුණු විශේෂයෙන් පහන් වූ දියෙන් මුවවිට දක්වා පිරුණේ පිටතට දිය නික්මවමින් මෙන් සිටියේ යැයි මේ සිත විය. මෙසේ සිතා පාත්‍රයෙන් පැන් ගෙන භාග්‍යවතුන් වහන්සේ කරා එළඹුණා හ.

## තෙරසමො පාඨො

# තෙ නමස්සාමි මාතලී

භූතපුබ්බං භික්ඛවෙ සක්කො දෙවානමින්දො මාතලිං සඞ්ගාහකං ආමන්තෙසි. යොජෙහි සම්ම, මාතලි, සහස්සයුත්තං ආජඤ්ඤරථං. උය්‍යානභූමිං ගච්ඡාම සුභූමිං දස්සනායාති. එවං භද්දන්තවාති ඛො භික්ඛවෙ මාතලි සඞ්ගාහකො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා සහස්සයුත්තං ආජඤ්ඤරථං යොජෙත්වා සක්කස්ස දෙවානමින්දස්ස පටිවෙදෙසි. යුත්තො ඛො තෙ, මාරිස, සහස්සයුත්තො ආජඤ්ඤරථො යස්සදානි කාලං මඤ්ඤසීති. අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො වෙජයන්තපාසාදා ඔරොහන්තො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සති. අථ ඛො භික්ඛවෙ මාතලි සඞ්ගාහකො සක්කං දෙවානමින්දං ගාථාය අජ්ඣභාසි.

තං නමස්සන්ති තෙවිජ්ජා - සබ්බෙ භුම්මා ච ඛත්තියා,
චත්තාරො ච මහාරාජා - තිදසා ච යසස්සිනො,
අථ කො නාම සො යක්ඛො - යං ත්වං සක්ක නමස්සසීති.

අහඤ්ච සීලසම්පන්නෙ - චිරරත්තසමාහිතෙ,
සම්මා පබ්බජිතෙ වන්දෙ - බ්‍රහ්මචරියපරායනෙ.

යෙ ගහට්ඨා පුඤ්ඤකරා - සීලවන්තො උපාසකා,
ධම්මෙන දාරං පොසෙන්ති - තෙ නමස්සාමි මාතලී ති.

( සක්කනමස්සන සුත්ත සංයුත්තනිකාය)

## දහතුන් වැනි පාඩම
## තෙ නමස්සාමි මාතලී

මහණෙනි පෙර වූවක් කියමි. සක් දෙවිඳු මාතලී රියදුරා ඇමතී ය. සගය, මාතලී. දහසින් යුත් ආජඤ්ඤරථය යොදවුව. මනා බිම වූ උයන්බිම දක්නට යමු. මහණෙනි, එසේ ය, නුඹට යෙහෙකි වේවායි, මාතලී රියදුරු තෙමේ සක්දෙවිඳුහට පිළිවදන් දී දහසින් යුතු ආජඤ්ඤ රථය යොදා සක් දෙළුහට නිදුකානෙනි, දහසින් යුතු ආජඤ්ඤ රථය යොදන ලදි. එයට දැන් කල් දනුවයි සැළ කළේ ය.මහණෙනි. ඉක්බිති සක්දෙව්රජ විජයොත් පහයෙන් බස්නේ ඇඟිලි බැඳ හැම දිශා නමදියි. මහණෙනි, එකල්හි මාතලී රිදුරු සක්දෙව් රජුට ගාථාවෙන් මෙසේ කීවේ ය.

වේදත්‍රය හදාරන සියලු භූ ලෝකවාසීහූ ද ක්ෂතියයෝ ද සතරවරම් දෙව්මහරජහු ද යසස් ඇති දෙවියෝ ද නුඹට වඳිති. ඉදින් සක් දෙවිඳුනි, නුඹ යමකු වන්දනා කරන්නාහු නම් කියන් සත්ත්වයෙක් ද?

## අත්වැළ

මම ද ශීලයෙන් සමන්විත වූ බොහෝ කලක් මුළුල්ලෙහි එකඟ කළ සිත් ඇති බඹසර විසූයේ තත්පර වූ පැවිද්දන් මැනවින් වඳිමි.

පින් කරන සිල්වත් වූ ගෘහස්ථ යම් උපාසක කෙනෙක් දැහැමෙන් අඹුදරුවන් පෝෂණය කරද්ද මාතලී මම ඔවුන් නමඳිමි.

පදියතලාවේ ඤාණවිමල හිමි

මො / ශ්‍රී විද්‍යානන්ද පිරිවෙණ

යල්කුඹුර - බිබිල

2020. 12. 13 දින